**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **7 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 7** |
| **First Term Test** | **2018** | **Grade 7** |

***දේශීය නර්තනය – I,II***
***Dancing - I,II***

***පැය 1½ යි***
***1 ½ hours***

නම/විභාග අංකය :- ..................................................................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 10 දක්වා වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(1) නර්තනයේ මූලික අංගහාරය වන්නේ,

i. නමස්කාරයයි. ii. පා සරඹයි. iii. මණ්ඩියයි. iv. දණ්ඩියයි.

(2) ශරීරික නම්‍යතාවය ඇතිකර ගැනීම සඳහා වැදගත් වන්නේ ..................... අභ්‍යාසයයි.

i. පාද චලන ii. නම්‍යතා iii. ස්රීතික චලන iv. සංචාරී චලන.

(3) උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් අත් සමඟ නටන සරඹ පිළිවෙළින්,

i. පා සරඹ, ගොඩ සරඹ, ඉලංගම් සරඹ
ii. මණ්ඩි පද, පා සරඹ, ගොඩ සරඹ
iii. දොඹින පද, මණ්ඩි පද, පා සරඹ
iv. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද.

(4) අතීතයේ දී මෙම මල පිපුණ විට ගම් හතක් පාළු වූවායැයි සැලකේ,

i. පුවක් මල. ii. පොල් මල iii. තල මල iv. කිතුල් මල

(5) 7 ශේණියේ දී ඔබ ඉගෙන ගන්නා නැටුම් සම්ප්‍රදායට අයත් වන්නමේ තාල රූපය වන්නේ

i. මාත්‍රා 2 + 3 දෙතිය ය.
ii. මාත්‍රා 2 + 4 දෙතිය ය.
iii. මාත්‍රා 3 + 4 දෙතිය ය.
iv. මාත්‍රා 3 + 3 තනි තිතය ය.

(6) පා සරඹ නර්තනයේ දී උපයෝගී කර ගත්තායැයි සැලකෙන උපකරණය වන්නේ.

i. දණ්ඩි කඳයි. ii. කානුවයි. iii. ලී යයි. iv. මඩුවයි.

(7) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ.

i. ගැටබෙරයයි. ii. පහතරට බෙරයයි. iii. දවුලයි. iv. තම්මැට්ටමයි.

(8) වත්ත කතත් කතත් තා ..... මෙම රබන් පදය .......................................තනි තිතට වාදනය කළ හැක.

i. මාත්‍රා 2 + 2 ii. මාත්‍රා 3 + 3 iii. මාත්‍රා 4 + 4 iv. මාත්‍රා 2 + 3

(9) අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි .... මෙය

i. ලී කෙළි කවියකි. ii. කළගෙඩි කවියකි. iii. කුළු කවියකි. iv. තාලම් කවියකි.

(10) නත්තල් උත්සවය පවත්වන දිනය ලෙස සැලකෙන්නේ....

i. පෙබරවාරි 4 වෙනිදාය.
ii. දෙසැම්බර් 25 වෙනිදාය.
iii. අප්‍රේල් 14 වෙනිදාය.
iv. ඔක්තෝම්බර් 06 වෙනිදාය.

➢ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර සොයා යා කරන්න.

| | |
|---|---|
| (11) තාලම්පටින් නිකුත් වන ශබ්දය | තුනකි. |
| (12) උඩරට නැටුම් සම්ප්‍රදාය | මහබඹා |
| (13) දෙතිතේ ප්‍රභේද | තිත්, තෙයි |
| (14) සමන් දේවාලයේ පෙරහැර | වෙස් ඇඳුම් |
| (15) පා සරඹ අවසන් කරන පදය | හමාර පදය |

➢ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.

(16) සෑම සරඹයක්ම ලය තුනට නැටිය යුතුය. (............)

(17) හෙණ හඬ විදුලි කෙටීම නියඟයට පෙර ලකුණුය. (............)

(18) වන්නම් ගායනා රහිත නර්තනාංගයකි. (............)

(19) දික් බෙරය, පහතරට බෙරයට තවත් නමකි. (............)

(20) කළගෙඩි නැටුම කරනු ලබන්නේ පිරිමි පක්ෂය විසිනි (............)

## II - කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 2 ක් තෝරා පිළිතුරු ලියන්න.**

01. (i) පා සරඹ / මණ්ඩි පද ගණන .................................................................................................................. කි.

(ii) වන්නම සම්පූර්ණයෙන් අවසන් වන්නේ ....................................................................................................... නි.

(iii) ............................................................................................................ මාත්‍රා 2 තනි තිතට අයත් බෙර / දවුල් පදයයි.

(iv) ................................................................................................................................................ ද්‍රවිඩ ජන නැටුමකි.

(v) මව් සෙනහස ප්‍රකාශ කරන ගී ................................................................................................ ගී නමින් හැඳින්වේ.

( 2 X 5 = 10)

(02) (i) ඔබ ඉගෙන ගත් වන්නමක බෙර පදය ප්‍රස්තාර කරන්න.

(ii) තානම හා කවි පදයක් ලියන්න.

( 5 X 2 = 10)

(03) (i) ඔබ දන්නා සිංහල ජන නැටුම් වර්ග 4 ක නම් ලියන්න. ල. 4

(ii) ඉන් එකකට අයත් කවියක් ලියන්න. ල. 3

(iii) ජන නැටුම් 2 ට අයත් උපකරණ දෙකක රූප සටහන් අඳින්න. ල. 3

(04) (i) ශ්‍රී ලාංකේය ප්‍රධාන නැටුම් සම්ප්‍රදායන් තුන නම් කරන්න. ල 3

(ii) ප්‍රධාන ඇඳුම් කට්ටල් නම් කරන්න. ල. 3

(iii) ඔබ කැමති බෙරයක රූප සටහනක් අඳින්න. ල. 4